ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1998 අප්‍රේල් මස 03 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 8.00 යි. **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 31 වන දින.]

එල්. ඩී.-ඕ. 38/96.

"ශ්‍රම වාසනා අරමුදල" යන නාමයෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස ද, සේවා නියුක්තයන්ගේ සුභසාධනය සඳහා මුදල් සැපයීම පිණිස සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "ශ්‍රම වාසනා අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීම.

(2) අරමුදල, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇත්තේ ය: තවද එකී නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි මින් ඉදිරියට විධිවිධාන සලස්වා ඇති පරිදි සංයුක්ත වන, භාරකාර මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය. අරමුදලේ භාරකාර මණ්ඩලය.

(2) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනතින් අරමුදල වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සෑදීමට බලය ඇත්තේ ය.

2—D047286—5,900(98/01)

මණ්ඩලයේ සංයුතිය.

4. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා:

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක්:

(ඇ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් හතර දෙනෙක් ;

(2) (අ) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, සෑම පත් කළ සාමාජිකයකු ම, ඔහු ඒ ධුරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු යː

(ආ) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු විසින් ම තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් භාරගනු ලැබූ විට බලාත්මක වන්නේ යː

(ඇ) පත් කළ සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් කිසි හේතු දැක්වීමකින් තොරව, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි යː

(ඈ) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට කාර්ය ඉටු කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි යː

(ඉ) යම් පත් කළ සාමාජිකයකු මියගියහොත් හෝ ඉල්ලා අස්වූවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය:

(ඊ) කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) (අ) සභාපතිවරයා, මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුතු ය:

(ආ) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය:

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. එසේ පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත්කිරීමෙහි ලා දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවන්නේ ය.

(4) යම් තැනැත්තෙක්–

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් වේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන නීතියක් යටතේ වස්තුභංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශිතව, නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් හෝ බංකොලොත් තැනැත්තකු නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටී නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ගනු ලැබීමට හෝ එසේ තවදුරටත් කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සෙක් නොවිය යුතු ය.

අරමුදලේ මුද්‍රාව.

5. (1) (මෙහි මින් මතු "මුද්‍රාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තන් භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ අනුමතය හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලය විසින් මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල හෝ ලේඛනවල ලැයිස්තුවක් තබාගනු ලැබිය යුතු ය.

අරමුදලේ අරමුණු.

6. පහත සඳහන් අරමුණු අරමුදලේ අරමුණු විය යුතු යః–

(අ) සේවා නියුක්තයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම;

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම:

(ඇ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම:

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම:

(ඉ) ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම:

(ඊ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය.

7. (1) අරමුදලේ අරමුණු ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු දේ අරමුදලේ නමින් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු යः–

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය මගින්, "ශ්‍රම වාසනා" යනුවෙන් හඳුන්වනු ලබන ලොතරැයියක් පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම:

(ආ) අරමුදල් රැස්කිරීම, දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන්‍යාකාර වූ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

(ඇ) අරමුදලේ අරමුණු වැඩිදියුණු කිරීම සඳහා ආධාර පරිත්‍යාග, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම:

(ඈ) යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

(ඉ) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා මණ්ඩලයේ බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත්ව ඒ ගිවිසුම් ඉටු කිරීම:

(ඊ) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අවසන් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම:

(උ) අරමුදලට අයත් හෝ අරමුදල විසින් දරනු ලබන කවර හෝ ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම:

(ඌ) අරමුදලට අයත් මුදල්, මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීම සහ ඒ ආයෝජනවලින් උපචිත වන මුදල් එකතු කර ගැනීම:

(එ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ එම ගිණුම් වැසීම, අරමුදලේ කාර්ය සඳහා ඇප ඇතිව හෝ නොමැතිව ණය මුදල් ලබා ගැනීම:

(ඒ) අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමෙහි ලා ආනුෂංගික හෝ හිතකර සියලු ක්‍රියා හෝ දේ කිරීම.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයට විධාන කළ හැකි බව.

8. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මණ්ඩලයට ලියවිල්ලක් මගින් යම් පොදු විධාන දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

අරමුදලේ කටයුතු විමර්ශනය කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

9. අමාත්‍යවරයා විසින් කලින් කළ ලියවිල්ලකින් වූ නියමයක් මගින් අරමුදලේ කටයුතු සියල්ල හෝ ඒ අතුරෙන් කිසිවක් හෝ විමර්ශනය කර නැතහොත් පරීක්ෂා කර, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත ඒ පිළිබඳව වාර්තාවක් සපයන ලෙස, ඒ නියමයේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය විය හැකි යම් පහසුකම් සැලසීම සහ තොරතුරු සැපයීම මණ්ඩලය විසින් කළ යුතු ය.

අරමුදලට ගෙවීම.

10. (අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් ;

(ඇ) අරමුදල මගින් කරන ආයෝජනවලින් ආදායම වශයෙන් ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයිවලින් ලැබෙන මුදල් ද ඇතුළුව, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අරමුදලට ලැබෙන සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

11. (අ) අරමුදල ක්‍රියා කරවීමේ දී, පිහිටුවීමේ දී සහ පවත්වා ගෙන යාමේ දී දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; අරමුදලෙන් ගෙවීම.

(ආ) අරමුදලේ නිලධරයන්ට හා සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ඇ) අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය අනුමත කරන ගෙවීම් සඳහා අවශ්‍ය සියලු මුදල්

අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

12. (1) මණ්ඩලය විසින්, අරමුදලේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ අරමුදලේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නියි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය. ගිණුම් හා විගණනය.

(2) යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් මණ්ඩලයේ ආදායම් හා වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

13. (1) මෙහි මින් මතු "ලොතරැයි මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 11 දරන මුදල් පනතින් පිහිටුවන ලද ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේ දී පවත්වනු ලැබිය යුතු ය. ලොතරැයි මණ්ඩලය විසින් අරමුදල සඳහා ලොතරැයි පැවැත්විය යුතු බව.

(2) ඒ සෑම ලොතරැයියක් ම 'ශ්‍රම වාසනා' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර, අරමුදල සහ ලොතරැයි මණ්ඩලය එකඟවන ආකාරයකින් පැවැත්විය යුතු ය. අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇතිකර ගන්නා එකඟවීමට, වෙනත් කරුණු අතර, එසේ පවත්වන ලොතරැයිවල දී ප්‍රදානය කරන තෑගි පිළිබඳව සහ ඒ ලොතරැයිවල දී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව විධිවිධාන ඇතුළත් විය යුතු ය.

(3) අරමුදල සඳහා ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම ලොතරැයියකින් ම ලැබෙන මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු, ඒ ඒ ලොතරැයියේ දී ප්‍රදානය කළ යුතු තෑගිවල වටිනාකම ද ඇතුළුව ඒ ලොතරැයිය පැවැත්වීමේ වියදම වශයෙන් ලොතරැයි මණ්ඩලය සහ අරමුදල එකඟ වන මුදල් ප්‍රමාණයන් අඩුකර ගැනීමෙන් පසුව, ලොතරැයි මණ්ඩලය විසින්, ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(4) ලොතරැයි මණ්ඩලය විසින් අරමුදල වෙනුවෙන් පවත්වනු ලබන යම් ලොතරැයියකින් අරමුදලට ලැබෙන යම් අදායමක් හෝ ලාභයක් මත 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ කිසිදු බද්දක් ගෙවීමෙන් අරමුදල නිදහස් විය යුතු ය.

(5) ලොතරැයි ආඥාපනතේ විධිවිධාන, අරමුදල වෙනුවෙන් ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් ලොතරැයියකට අදාළ නොවිය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලය සතු බලය.

14. මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය සලකන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

අරමුදල ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

15. (1) යම් තැනැත්තකු විසින් මුදලින් හෝ අන්‍යාකාරයකින් අරමුදලට කරන පරිත්‍යාගයක්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද පරිත්‍යාගයක් ලෙස සැලකිය යුතු ය.

(2) අරමුදල, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය යටතේ ඇතුළත් කරනු ලැබූ දින සිට සහ ඉන් පසුව, අරමුදලේ ලාභ සහ ආදායම, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බදුවලින් නිදහස් විය යුතු ය.

(3) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ සහ රේගු ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට ආරක්ෂාව.

16. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ අරමුදලේ නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අරමුදල විසින් හෝ අරමුදලට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදල විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදලට ගෙවූ හෝ අරමුදලට ලැබුණු ගාස්තු කිසිවක් වේ නම් ඒවා අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගෙන ඇත්නම් මිස, ඒ ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට එරෙහිව හෝ කිසි රිට් ආඥාවක් නිකුත් නොකල යුතු බව.

17. අරමුදලට විරුද්ධව පවරන ලද කිසිම නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික වශයෙන් හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතුබව.

18. අරමුදල, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් තේරුම් ගත යුතු ය.

අරමුදලේ නිලධරයන් හා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකිය යුතු බව.

19. අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

20. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

21. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ–

"සේවා නියුක්තයා" යන්නෙන්, සේවා යෝජකයකු සමග ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ හෝ සේවා යෝජකයකු යටතේ ලිඛිතව හෝ අන්‍යාකාරව වේවා, එමෙන්ම සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් වේවා, නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් යම් වැඩක් පෞද්ගලිකව ක්‍රියාත්මක කිරීම පිණිස වූ ගිවිසුමක් වේවා කවර වූ යම් කොටසකින් ගිවිසුමකට ඇතුලු වූ හෝ ගිවිසුමක් යටතේ සේවය කරන්නා වූ තැනැත්තෙක් අදහස් වන අතර, ඊට කිසියම් නියමිත වේලාවක සේවා නියුක්තියේ යෙදී සිටිය ද නොසිටිය ද ඒ යම් ගිවිසුමක් යටතේ සේවයේ නියුක්ත කර සිටින යම් තැනැත්තෙක් ද ඇතුළත් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.